FMM SRI LANKA නිදහස් මාධ්‍ය ව්‍යාපාරය சுதந்திர ஊடக இயக்கம் Free Media Movement

# මාධ්‍ය නිදහස: නිරීක්ෂණ වාර්තාව
## ஊடக சுதந்திரம்: கண்காணிப்பு அறிக்கை
## Media Freedom Rights Monitoring Report

MFRMD

**2021 සැප්තැම්බර්** කලාප අංක 09










**මාධ්‍ය නිදහසට අදාළව ඒ ඒ මාසය තුළ වාර්තා වන සිදුවීම්, පූර්ව සිදුවීම්වලට අදාළ වර්ධනයන් හා ඒවාට අදාළ නිරීක්ෂණ මෙම වාර්තාවට ඇතුළත් වේ. මාධ්‍යවේදීන්ගේ මෙන්ම ජනතාවගේ භාෂණයේ හා අදහස් ප්‍රකාශ කිරීමේ අයිතිය සම්බන්ධ සිදුවීම්, නව නීති පැනවීම් හා ජාත්‍යන්තර ප්‍රජාව දක්වන ප්‍රතිචාර කෙරෙහිද මෙහිදී අවධානය යොමු කර ඇත. මාධ්‍ය නිදහස පිළිබඳව නිරීක්ෂණය කිරීම සඳහා නිදහස් මාධ්‍ය ව්‍යාපාරය තෝරා ගෙන ඇති විෂය පථයට / සංරචකයන්ට අදාළ සිදුවීම් 12ක් සැප්තැම්බර් මාසය තුළ නිරීක්ෂණය විය. පුරවැසියන්ගේ සියලු ආකාරයේ නිදහසට අහිතකර බලපෑමක් ඇති කරන හදිසි නීතිය බලාත්මක කිරීම පාර්ලිමේන්තු විසින් අනුමත කරනු ලැබීමද, පුවත්පත් කතුවරුන් හා මාධ්‍යවේදීන් කිහිපදෙනෙකු ප්‍රශ්න කිරීම සඳහා අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට කැඳවීමද මේ මාසයේ සිදුවීම් අතර කැපී පෙනිණි. නිදහස් මාධ්‍ය ව්‍යාපාරයද ඇතුළත් මාධ්‍ය සංවිධාන එකතුව, රජයේ මෙම පිළිවෙත තරයේ හෙළාදකිමින් නිවේදනයක් නිකුත් කළේය.**

## සැප්තැම්බර් මාසය තුළ වාර්තා වූ සිදුවීම්

1. අම්පාරේ නිදහස් මාධ්‍යවේදී ෂාහීර්ඛාන් ෆාරුක්ට පොලිසිය පහරදීම හා කැමරාවට හානි සිදු කිරීම
2. ජනාධිපතිවරයා විසින් හදිසි නීතිය පැනවීම හා පාර්ලිමේන්තුවේදී බහුතර ඡන්දයෙන් එය සම්මත වීම.
3. මාධ්‍යයට කළ ප්‍රකාශයක් හේතුවෙන් මඩකලපුවේ මාධ්‍යවේදියකු හා සමාජ ක්‍රියාකාරිකයකු වන පුණ්‍යමූර්ති සසිකරන් පොලිසියේ ප්‍රශ්න කිරීමට ලක් වීම.
4. මාධ්‍යවේදී ප්‍රගීත් එක්නැලිගොඩ අතුරුදන් වීම සම්බන්ධයෙන් 'අතුරුදන්වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයට ඉදිරිපත් කළ පැමිණිල්ලට එම කාර්යාලය දැක්වූ ප්‍රතිචාරයෙන්, අගතියට පත් පාර්ශ්වය අතෘප්තියට පත් වීම.
5. ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත හා හදිසිනීතිය පිළිබඳ මාර්ගගත සංවාද මාලාවක් ශ්‍රී ලංකා තරුණ ජනමාධ්‍යවේදීන්ගේ සංගමය සහ ශ්‍රී ලංකා පුවත්පත් ආයතනය විසින් සංවිධානය කිරීම.
6. තොරතුරු පනත ඔස්සේ ලබාගත් තොරතුරු සාක්ෂි ලෙස යොදාගත්, මැතිවරණ දූෂණය සමාජ වැදගත්කමක් දරන නඩුවක් ජයග්‍රහණය කිරීම.

7. කොතලාවල පනතට එරෙහි උද්ඝෝෂණය සම්බන්ධයෙන් අත්අඩංගුවට ගත් ක්‍රියාකාරිකයින් 5දෙනා තවදුරටත් රිමාන්ඩ් භාරයේ තැබීමට අධිකරණය නියෝග කිරීම.

8. තොරතුරුවලට ප්‍රවේශවීමේ ජාත්‍යන්තර දිනය නිමිත්තෙන් නිදහස් මාධ්‍ය ව්‍යාපාරය විවෘත සංවාදයක් පැවැත්වීම. (මැතිවරණ දූෂණ සම්බන්ධයෙන් ජයගත් නඩුව තේමා කරගෙන)

9. ශ්‍රී ලංකාවේ මානව හිමිකම් චර්යාව අධ්‍යයනය කිරීම සඳහා යුරෝපා සංගමයේ දූත මණ්ඩලයක් මෙරට සංචාරයක නිරත වීම.

10. සතොස ආයතනයේ සිදු වීයැයි කියන මහාපරිමාණ දූෂණයක් පිළිබඳව පළ කළ පුවත් සම්බන්ධයෙන් ලංකාදීප, දිවයින සහ 'ද අයිලන්ඩ්' පුවත්පත්වල කතුවරු ඇතුළු මාධ්‍යවේදීන් පිරිසක් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට කැඳවීම.

11. අත්අඩංගුවට ගෙන රඳවාගෙන සිටින, ලංකා ඊ නිව්ස් මාධ්‍යවේදී කීර්ති රත්නායක විසින් දෙන ලදැයි කියන දුරකථන ඇමතුමක් පිළිබඳව ප්‍රශ්න කිරීමට මෝස්තර නිරූපණ ශිල්පිනී චූලා පද්මේන්ද්‍ර අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව වෙත කැඳවීම.

12. සන්ඩේ ලීඩර් පුවත්පතේ කර්තෘ ලසන්ත වික්‍රමතුංග ඝාතනය කිරීම සම්බන්ධයෙන් එළඹෙන නොවැම්බර් 02 වැනිදා නෙදර්ලන්තයේ හේග් නුවර පිහිටි 'මාධ්‍යවේදී ඝාතනයන් පිළිබඳ නිත්‍ය මහජන අධිකරණය' The People's Tribunal on the Murder of Journalists විසින් නඩු විභාගයක් පැවැත්වීමට දින නියම කිරීම.

**1 වගුව: වාර්තා වූ සමස්ත සිදුවීම් - 2021 සැප්තැම්බර්**

| අංකය | ආවරණය කර ඇති සංරචකය | වාර්තා වූ සිදුවීම් සංඛ්‍යාව |
|---|---|---|
| 01 | ආරක්ෂාව සහ සුරක්ෂිතබව | 05 |
| 02 | නීතිමය කොන්දේසි | 04 |
| 03 | ව්‍යුහාත්මක කොන්දේසි | 03 |
| | **එකතුව** | **12** |

## ආරක්ෂාව සහ සුරක්ෂිතබව

**මාධ්‍යවේදීන්ට තම වෘත්තිය ශාරීරික සහ මානසික ඒකාග්‍රතාවකින් යුක්තව නිදහස් ලෙස කර ගෙන යෑමේ වාතාවරණයක් පැවතීම ජනමාධ්‍ය නිදහස පිළිබඳ මූලික කොන්දේසියකි. එමෙන්ම ජනමාධ්‍ය නිදහස හා අදහස් පළ කිරීමේ නිදහස ආරක්ෂා වීමට නම්, පුරවැසියන්ට අනිටු ප්‍රතිවිපාකවලට මුහුණදීමේ අවදානමකින් තොරව ජනමාධ්‍ය ඔස්සේ හෝ වෙනත් ආකාරවලින් නිදහසේ අදහස් පළ කළ හැකි වාතාවරණයක් පැවතිය යුතුය. සාමකාමීව රැස්වීමේ, විරෝධය පළ කිරීමේ හා උද්ඝෝෂණවල නිරත වීමේ නිදහසද අදහස් පළ කිරීමේ නිදහසට අයත් වේ. මෙම මූලික නිදහස උල්ලංඝනය වූ අවස්ථා 5ක් අගෝස්තු මාසය තුළ දී වාර්තා විය. සාපරාධී අපහාස නීතිය නීති පොතෙන් ඉවත් කර තිබියදීත්, එය බලාත්මකව පැවති සමයේ මෙන් ඇමතිවරුන්ගේ පැමිණිලි මත කතුවරුන් හා ජනමාධ්‍යවේදීන් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට කැඳවීමේ අහිතකර ප්‍රවණතාවක් මතු වෙමින් තිබෙන බවද නිරීක්ෂණය විය.**

**2 වගුව: 2021 සැප්තැම්බර්: මාධ්‍යවේදීන්ගේ ආරක්ෂාව සහ සුරක්ෂිතබව - සිදුවීම් 05**

| අංකය | දර්ශකය | වාර්තා වූ සිදුවීම් සංඛ්‍යාව |
|---|---|---|
| 01 | පහරදීම | 01 |
| 02 | මානසික බලපෑම් | 04 |
| | **එකතුව** | **05** |

1. **අම්පාරේ නිදහස් මාධ්‍යවේදී ෂාහීර්ඛාන් ෆාරුක්ට පොලිසිය පහරදීම හා කැමරාවට හානි සිදු කිරීම.**

   අක්කරෙයිපත්තු පොලිසියේ නිලධාරීන් සැප්තැම්බර් 2 වැනි බ්‍රහස්පතින්දා පෙරවරුවේ නිදහස් මාධ්‍යවේදියකු වන ෂාහීර්ඛාන් ෆාරුක් ට පහර දී ඔහුගේ වීඩියෝ කැමරාවට හානි සිදු කර ඇති අතර, ඔහු බලහත්කාරයෙන් ජීප් රියක නංවාගෙන පොලිසිය වෙත රැගෙන ගොස් තිබේ.

අම්පාර අට්ටාලවේන පිහිටි සිය නිවසේ සිට වාර්තාකරණ කාර්යයක් සඳහා බැහැරට යමින් සිටියදී, පොලිසිය ඔහුට පහර දී ඇත්තේ නිසි පරිදි මුඛ ආවරණය පැළඳ නොමැති බවට චෝදනා කරමිනි. අක්කරේපත්තු පොලිසියේ පැය දෙකකට ආසන්න කාලයක් රඳවා තබා ගැනීමෙන් පසු මාධ්‍යවේදියා නිදහස් කර ඇති අතර, පහර දීමට සම්බන්ධ නිලධාරීන් ඔහුගෙන් සමාව ගෙන, කැමරාවට සිදු වූ හානිය සඳහා වන්දි මුදලක් ලබා දීමට එකඟ වී තිබේ. එහෙත් එකඟතාව පරිදි කටයුතු කර නොමැති අතර මාධ්‍යවේදියා මේ පිළිබඳව මානව හිමිකම් කොමිෂන් සභාව වෙත පැමිණිල්ලක් ඉදිරිපත් කර ඇත.

මූලාශ්‍රය: theleader.lk

2. **මාධ්‍යයට කළ ප්‍රකාශයක් හේතුවෙන් මඩකලපුවේ මාධ්‍යවේදී පුණ්‍යමූර්ති සසිකරන් පොලිසියේ ප්‍රශ්න කිරීමට ලක් වීම.**

සැප්තැම්බර් 14 වැනිදා මඩකලපුව ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී කාර්යාලයේ ස්ථාපිත කර තිබෙන විශේෂ අපරාධ විමර්ශන ඒකකයකට කැඳවා පැයකට ආසන්න කාලයක් තමාගෙන් ප්‍රකාශ සටහන් කරගත් බව මාධ්‍යවේදී පුණ්‍යමූර්ති සසිකරන් ප්‍රකාශ කරයි. එහිදී පොලිසිය ඔහුගෙන් ප්‍රශ්න කර ඇත්තේ, ඔහු අත්අඩංගුවට ගැනීමේ සූදානමක් පවතින බවට 'සිලෝන් නිවුස්' නම් වෙබ් අඩවියක පළ කර ඇති පුවත සඳහා එම වෙබ් අඩවිය ඔහුගෙන් සම්මුඛ සාකච්ඡාවක් ලබාගත්තේද යන්නයි.

සසිකරන් එහිදී පොලිසියට පවසා ඇත්තේ, දිගින් දිගටම පොලිසිය තමාගෙන් සිදු කෙරෙන ප්‍රශ්න කිරීම් හමුවේ 'තමන් අත්අඩංගුවට ගැනීමේ සූදානමක් ඇති බව ඇඟවෙන්නේනැයි' පසුගිය අගෝස්තු 23 වැනිදා පොලිසියට ප්‍රකාශ ලබා දීමෙන් පසු මාධ්‍යවේදීන් හමුවේ කළ ප්‍රකාශය එම පුවතට පසුබිම් වී ඇති බවයි.

පුණ්‍යමූර්ති සසිකරන් මීට පෙර අවස්ථා කිහිපයකදීම පොලිසියේ ප්‍රශ්න කිරීමට ලක්ව ඇති අතර, ශ්‍රී ලංකා නාවික හමුදාවට චෝදනා එල්ල වී ඇති- ඝාතනයට ලක් වූ ඉන්දීය ධීවරයින් අනුස්මරණය කිරීමේ රැස්වීමක් සංවිධානය කළේය යන සැකය මත පොලිසිය දිගින් දිගටම තමන්ගෙන් ප්‍රශ්න කරන බවත්, එම ක්‍රියාවට තමන්ගේ සම්බන්ධයක් නැති බවත් ඔහු මාධ්‍ය වෙත ප්‍රකාශ කර තිබිණි. දිගින් දිගටම සිදු වන පොලිස් ප්‍රශ්නකිරීම් සම්බන්ධයෙන් ඔහු ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ මඩකලපුව ශාඛාවට පැමිණිල්ලක් ඉදිරිපත් කර තිබේ.

මූලාශ්‍රය: theleader.lk

3. **මාධ්‍යවේදී ප්‍රගීත් එක්නැලිගොඩ අතුරුදන් වීම සම්බන්ධයෙන් 'අතුරුදන්වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය'ට ඉදිරිපත් කළ පැමිණිල්ලට එම කාර්යාලය දැක්වූ ප්‍රතිචාරයෙන්, අගතියට පත් පාර්ශ්වය අතෘප්තියට පත් වීම.**

මාධ්‍යවේදී ප්‍රගීත් එක්නැලිගොඩ අතුරුදන් කිරීම සම්බන්ධයෙන් අතුරුදන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයට (OMP) කළ පැමිණිල්ලකට ප්‍රතිචාර ලෙස, අදාළ පැමිණිල්ල සඳහා තොරතුරු ප්‍රමාණවත් නොවන බව එම කාර්යාලය දැනුම් දී ඇති අතර පැමිණිලිකාරිය වන සන්ධ්‍යා එක්නැලිගොඩ ඒ සම්බන්ධයෙන් විවේචනාත්මක පිළිතුරක් යොමු කර ඇත.

'අතුරුදහන්වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයේ' වත්මන් සභාපති උපාලි අබේරත්න, දේශපාලන පළිගැනීම් පිළිබඳ ජනාධිපති කොමිසමේ සභාපති වශයෙන් සිටියදී ප්‍රගීත් එක්නැලිගොඩ පැහැර ගැනීම පිළිබඳව පැවැත්වෙන නඩු විභාග දෙකෙහි (HC 209/19 සහ HC (TAB) 725/19) අධිචෝදනා ඉවත් කර චූදිතයින් නිදොස් කොට නිදහස් කළ යුතු බවටත් එම පැහැර ගැනීම පිළිබඳ පරීක්ෂණ කළ අපරාධ පරීක්ෂක දෙපාර්තමේන්තුවේ නිලධාරීන් දණ්ඩනයට ලක් කළ යුතු බවටත් නිර්දේශ කර ඇතැයි එම ලිපිය මගින් ඇය අවධාරණය කර තිබේ. එමෙන්ම ඉහත නඩු සම්බන්ධයෙන් පළිගැනීම් පිළිබඳ කොමිසම කරන ලද පරීක්ෂණයට තමා නොකැඳවූ බවද ඇය සඳහන් කර ඇත.

ජාත්‍යන්තර වශයෙන්ද අවධානයට ලක් වූ අතුරුදන්වීමක් පිළිබඳව පැහැදිලි සාක්ෂි සහිත නඩු දෙකක චූදිතයින් නිදහස් කිරීමට හා පරීක්ෂණ මෙහෙයවූ නිලධාරීන්ට දඬුවම් කිරීමට නිර්දේශ කළ පුද්ගලයකු 'අතුරුදන්වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයෙහි' සභාපතිවරයා ලෙස පත් කිරීම, එම ආයතනය පිළිබඳ විශ්වාසය පළුදු කිරීමක් බව මෙම සිදුවීමෙන් පිළිබිඹු වේ.

මූලාශ්‍රය: yournews.lk

4. **ලංකා ඊ නිව්ස් මාධ්‍යවේදී කීර්ති රත්නායක විසින් දෙන ලදැයි කියන දුරකථන ඇමතුමක් පිළිබඳව ප්‍රශ්න කිරීමට මෝස්තර නිරූපණ ශිල්පිනී චූලා පද්මේන්ද්‍ර අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව වෙත කැඳවීම.**

ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ රඳවාගෙන සිටින ලංකා ඊ නිව්ස් මාධ්‍යවේදී කීර්ති රත්නායක විසින් දෙන ලදැයි කියන දුරකථන ඇමතුමක් සම්බන්ධයෙන් මෝස්තර නිරූපණ ශිල්පිනී චූලා පත්මේන්ද්‍රගෙන් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව පැය 3ක පමණ කාලයක් ප්‍රශ්න කර තිබේ. ඇයට ඔක්තෝබර් 2 වැනිදා අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව හමුවේ පෙනී සිටින ලෙස සැප්තැම්බර් මස අගදී දැනුම්දීමක් කර තිබූ අතර, හේතුව කුමක්දැයි දැනුම් දී නොතිබිණි.

කලා ශිල්පිනියක ලෙස විවිධ මාධ්‍යවේදීන්ගේ ඇමතුම්වලට පිළිතුරු දීම සාමාන්‍ය සිදුවීමක් බවත්, 2020 විවාහක රූ රැජින තරගයේදී ඇති වූ ආන්දෝලනාත්මක සිදුවීම සම්බන්ධයෙන් මාධ්‍යවේදී කීර්ති රත්නායක තමන්ගෙන් දුරකථනයෙන් කරුණු විමසීම හැර එම මාධ්‍යවේදියා සමඟ වෙනත් හැඳුනුම්කමක් නොමැති බවත් ඇය ප්‍රකාශ කර තිබේ.

ලංකා ඊ නිව්ස් වෙබ් අඩවියේ මාධ්‍යවේදී කීර්ති රත්නායක, ඉන්දියානු තානාපති කාර්යාලයට ලබා දුන් තොරතුරක් හේතුවෙන් අත්අඩංගුවට ගෙන ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ දින 50කට අධික කාලයක් රඳවාගෙන සිටී. ඔහුගේ දුරකථන තොරතුරු පරීක්ෂා කිරීමෙන් පසු, සමාජමාධ්‍ය ක්‍රියාකාරිනියක වන තුෂාරා වන්නිආරච්චිද මෙබඳු ප්‍රශ්න කිරීමකට ලක් කෙරිණි.

මූලාශ්‍රය: youtube.com

5. **සතොස ආයතනයේ සිදු වී යැයි කියන මහා පරිමාණ වංචාවක් පිළිබඳව පළ කළ පුවත් සම්බන්ධයෙන් ලංකාදීප, දිවයින සහ 'ද අයිලන්ඩ්' පුවත්පත්වල කතුවරු ඇතුළු මාධ්‍යවේදීන් පිරිසක් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට කැඳවීම.**

පාරිභෝගික සේවා අධිකාරියේ හිටපු විධායක අධ්‍යක්ෂ තුෂාන් ගුණවර්ධන විසින් හෙළිදරව් කරන ලද සතොස ආයතනයේ සිදු වී ඇති මහාපරිමාණ වංචා හා දූෂණ වාර්තා කළ ලංකාදීප, දිවයින හා දි අයිලන්ඩ් පුවත්පත්හි කතුවරුන් හා මාධ්‍යවේදීන්, සැප්තැම්බර් 30 වැනිදා අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට කැඳවා තිබිණි. ඒ පිළිබඳව යවන ලද ලිඛිත දැනුම්දීමෙහි සඳහන් වූයේ අමාත්‍ය බන්දුල ගුණවර්ධන විසින් කරන ලද පැමිණිල්ලකට අදාළව ප්‍රකාශ ලබා ගැනීම සඳහා එසේ කැඳවන බවයි.

මාධ්‍යවේදීන් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට කැඳවීමෙන් වළකින ලෙස අගමැතිවරයා උපදෙස් දී ඇතැයි පසුව වාර්තා වූ නමුත් අදාළ ප්‍රකාශ ලබා ගැනීම සඳහා පොලිස් කණ්ඩායමක් 28 වැනිදා ලංකාදීප කාර්යාලය වෙත පැමිණ තිබේ. ලංකාදීප කතුවරයා එම අවස්ථාවේ ප්‍රකාශ ලබා දීම ප්‍රතික්ෂේප කර ඇත. පසුව මහජන ආරක්ෂක අමාත්‍යාංශය නිවේදනයක් නිකුත් කරමින් ප්‍රකාශ කළේ පුවත්පත් කතුවරුන් ඇතුළු මාධ්‍යවේදීන්ගෙන් ප්‍රශ්න නොකරන ලෙස දැනුම්දීමක් කර තිබියදී අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරීන් ඊට අදාළව ක්‍රියා නොකිරීම සම්බන්ධයෙන් වහාම විමර්ශනයක් සිදු කරන ලෙස මහජන ආරක්ෂක ඇමති සරත් වීරසේකර පොලිස්පතිවරයාට උපදෙස් දී ඇති බවයි.

මෙම සිදුවීම තරයේ හෙළාදකිමින් නිවේදනයක් නිකුත් කරන නිදහස් මාධ්‍ය ව්‍යාපාරයද ඇතුළත් මාධ්‍ය සංවිධාන එකමුතුව 'මෙය මාධ්‍යවේදීන් දඩයම් කොට දූෂිතයන් ආරක්ෂා කිරීමට ද, දූෂණ හෙළිදරව් කිරීම වැළැක්වීමට ද දරන ලද නිර්ලජ්ජිත උත්සාහයක් බව' ප්‍රකාශ කළේය.

## නීතිමය කොන්දේසි

**මාධ්‍ය නිදහසට අදාළව නීතිමය කොන්දේසි පිළිබඳ සංරචකය යටතට ගැනෙන සිදුවීම් 4ක් සැප්තැම්බර් මාසය තුළ නිරීක්ෂණය විය. පුරවැසියන්ගේ සියලු ආකාරයේ ප්‍රජාතන්ත්‍රවාදී අයිතිවාසිකම් අභියෝගයට ලක් කෙරෙන හදිසි නීතිය යළි පැනවීම ඒ අතරින් ප්‍රමුඛ සිදුවීමකි. එමෙන්ම මොනරාගල මැතිවරණ නඩුවේ තීන්දුව, තොරතුරු අයිතිය පුරවැසි සමාජයේ ප්‍රගමනයට හේතු වන ජයග්‍රහණ සඳහා දායක වන අයුරු පිළිබිඹු කළ සාධනීය සිදුවීමක් ලෙස සැලකිය හැකිය. ලසන්ත වික්‍රමතුංග ඝාතනය පිළිබඳව ජාත්‍යන්තර තලයේ නඩු විභාගයක් ආරම්භ වීම, 'මාධ්‍යවේදීන්ට එරෙහි අපරාධවලදී දණ්ඩමුක්තිය' යන දර්ශකයට අදාළ වන සාධනීය අවස්ථාවක් ලෙස නිරීක්ෂණයට ලක් වේ.**

**3 වගුව: 2021 සැප්තැම්බර්: නීතිමය කොන්දේසි - සිදුවීම් 04**

| අංකය | දර්ශකය | වාර්තා වූ සිදුවීම් සංඛ්‍යාව |
|---|---|---|
| 01 | නීතිමය ක්‍රියාමාර්ග ගැනීම | 01 |
| 02 | මාධ්‍ය නිදහසට බලපාන නීතිමය සීමා කිරීම් | 01 |
| 03 | තොරතුරු දැනගැනීමේ අයිතිය | 01 |
| 04 | මාධ්‍යවේදීන්ට එරෙහි අපරාධවලදී දණ්ඩමුක්තිය | 01 |
| | **එකතුව** | **04** |

1. **ජනාධිපතිවරයා විසින් හදිසි නීතිය පැනවීම හා පාර්ලිමේන්තුවේදී බහුතර ඡන්දයෙන් එය සම්මත වීම.**

ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහජන ආරක්ෂක පනත යටතේ නිකුත් කළ හදිසි නීති රෙගුලාසි ඇතුළත් ගැසට් නිවේදනය පිළිබඳ යෝජනාව සැප්තැම්බර් 6 වැනිදා වැඩි ඡන්ද 81 කින් පාර්ලිමේන්තුවේදී සම්මත විය.

සමගි ජන බලවේගය, ජාතික ජන බලවේගය සහ දෙමළ ජාතික සන්ධානය නියෝජනය කරන මන්ත්‍රීවරු යෝජනාවට විරුද්ධව ඡන්දය ප්‍රකාශ කළහ.

සැපයුම් සහ අත්‍යවශ්‍ය සේවාවන් පවත්වා ගෙන යෑමට පවතින බාධාවන් හේතුවෙන් හදිසි නීතිය ක්‍රියාත්මක කළ බව ජනාධිපතිවරයා ඇතුළු රජය ප්‍රකාශ කරයි. ප්‍රකාශිත අරමුණ කුමක් වුවත් හදිසි නීතිය පැනවීම මගින් ජනතාවගේ ප්‍රජාතන්ත්‍රවාදී අයිතිවාසිකම් බරපතළ ලෙස අභියෝගයට ලක් වන බව ඊට විරෝධය පළ කරන පාර්ශ්වයන්ගේ ස්ථාවරයයි. එමෙන්ම, එම ප්‍රකාශිත අරමුණ ඉටු කර ගැනීමට අදාළ නීතිමය ප්‍රතිපාදන පවතින බව ද එම පාර්ශ්ව පෙන්වා දී ඇත. ජාතික ජන බලවේගය මේ පිළිබඳව නිකුත් කළ නිවේදනයෙහි එම කරුණු අවධාරණය කර තිබේ.

මූලාශ්‍ර: 1. sinhala.srilankabrief.org 2. hirunews.lk

2. **කොතලාවල පනතට එරෙහි උද්ඝෝෂණය සම්බන්ධයෙන් අත්අඩංගුවට ගත් ක්‍රියාකාරිකයින් 5දෙනා තවදුරටත් රිමාන්ඩ් භාරයේ තැබීමට අධිකරණය නියෝග කිරීම.**

කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාල පනතට එරෙහිව විරෝධතා දැක්වීම හේතුවෙන් අත්අඩංගුවට ගෙන රක්ෂිත බන්ධනාගාර ගත කළ ශිෂ්‍ය හා දේශපාලන ක්‍රියාකාරිකයන් පස්දෙනා ඇප නියම නොකර තවත් දින 14කට රක්ෂිත බන්ධනාගාර ගත කිරීමට කඩුවෙල මහෙස්ත්‍රාත් අධිකරණය සැප්. 21 වැනිදා නියෝග කළේය. සිසුජන ව්‍යාපාරයේ කෝෂිලා හංසමාලි, පෙරටුගාමී සමාජවාදී පක්ෂයේ පාලක ලේකම් චමීර කොස්වත්ත, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයීය මහා ශිෂ්‍ය සංගමයේ සභාපති අමිල සංදීප, අ.වි.ශි.බ.ම. කැඳවුම්කරු වසන්ත මුදලිගේ සහ රජරට විශ්වවිද්‍යාලයේ හේෂාන් හර්ෂණ යන මෙම විරෝධතාකරුවන්ට ඇප ලබා දීමට පොලීසිය විරෝධය පළ කළ අතර, ඔවුන් වෙනුවෙන් හෝමාගම මහාධිකරණයට ඇප අයදුම්පතක් යොමු කර තිබේ.

පාර්ලිමේන්තුව අසල අගෝස්තු 3 වැනිදා පැවති විරෝධතාවකදී මිනිපෙට්ටියක කාඩ්බෝඩ් අනුරුවක් පිලිස්සීම නිසා රාජ්‍ය දේපළවලට රු 179,000ක හානියක් සිදු වූ බව කියමින්, පොලිසිය මෙම විරෝධතාකරුවන්ට එරෙහිව චෝදනා ගොනු කර ඇත්තේ පොදු දේපළ පනත යටතේය. ඔවුන් අත්අඩංගුවට ගනු ලැබුවේ, පොදු දේපළවලට හානි කරන අයුරු දැක්වෙන ඡායාරූප හා වීඩියෝ පටවල අඩංගු සාක්ෂි මත බව පොලිසිය ඔවුන් අධිකරණයට ඉදිරිපත් කළ පළමු දිනයේ ම ප්‍රකාශ කළ ද මෙතෙක් එවැනි කිසිදු ඡායාරූප හෝ වීඩියෝ සාක්ෂියක් අධිකරණයට ඉදිරිපත් කිරීමට කටයුතු කර නැත. මෙම විරෝධතාකරුවන්ගෙන් සිව් දෙනෙකුට බන්ධනාගාරයේ දී කෝවිඩ් ආසාදනය වීම නිසා, දැඩි සෞඛ්‍යමය අවදානමකටද ලක් විය. විරෝධතාකරුවන් අත්අඩංගුවට ගැනීමේ පිළිවෙත, අදහස් පළ කිරීමේ නිදහසට තර්ජනයක් බව අවධාරණය කරන නිදහස් මාධ්‍ය ව්‍යාපාරය, ඊට විරෝධය පළ කරමින් අගෝස්තු මාසයේදී නිවේදනයක් නිකුත් කළේය.

මූලාශ්‍රය: yournews.lk

3. තොරතුරු පනත ඔස්සේ ලබාගත් තොරතුරු සාක්ෂි ලෙස ගොනු කළ, මැතිවරණ දූෂණය සම්බන්ධ සමාජ වැදගත්කමක් දරන නඩුවක් ජයග්‍රහණය කිරීම.

'තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනත' උපයෝගී කරගෙන ලබාගත් තොරතුරු හා තවත් පුද්ගල සාක්ෂි මත පදනම් වූ සමාජ වැදගත්කමක් දරන සුවිශේෂ නඩුවක තීන්දුවක් මොනරාගල මහාධිකරණ විනිසුරු රංග දිසානායක විසින් සැප්තැම්බර් 13 වැනිදා ප්‍රකාශයට පත් කෙරිණි.

පසුගිය පළාත් පාලන මැතිවරණයේදී මොනරාගල දිස්ත්‍රික්කයේ පළාත් පාලන ආයතනයක අපේක්ෂකයෙකු මැතිවරණ කාලසීමාව තුළ ඡන්දදායකයින්ට විවිධ අල්ලස් ලබාදීම හේතුවෙන් අගතියට පත් ප්‍රතිවිරුද්ධ කණ්ඩායමේ අපේක්ෂකයකු විසින් මෙම නඩුව ගොනු කර තිබූ අතර, අල්ලස් ලබා දුන් අපේක්ෂකයාගේ මන්ත්‍රීධුරය අහෝසි කිරීමට අධිකරණය නියෝග කළේය.

පැෆ්රල් සංවිධානය සහ මැතිවරණ ප්‍රචණ්ඩ ක්‍රියා නිරීක්ෂණ මධ්‍යස්ථානයේද සහාය ඇතිව එම නඩුව ගොනුකර තිබුණි. මෙය මැතිවරණ ඉතිහාසයේ වැදගත් සංධිස්ථානයක් මෙන්ම තොරතුරු පනතෙහි වැදගත්කම අවධාරණය වූ අවස්ථාවක් ලෙසද ජනමාධ්‍ය හා සිවිල් සමාජයේ ඇගැයුමට ලක් විය.

4. **සන්ඩේ ලීඩර් පුවත්පතේ කර්තෘ ලසන්ත වික්‍රමතුංග ඝාතනය කිරීම සම්බන්ධයෙන් නඩු විභාගයක් සඳහා නෙදර්ලන්තයේ හේග් නුවර පිහිටි 'මාධ්‍යවේදී ඝාතනයන් පිළිබඳ නිත්‍ය මහජන අධිකරණය'** (The People's Tribunal on the Murder of Journalists) **දින නියම කිරීම.**

වසර 12කට පෙර සිදු වූ, ලසන්ත වික්‍රමතුංග ඝාතනය සම්බන්ධයෙන් එළඹෙන නොවැම්බර් 02 වැනිදා නෙදර්ලන්තයේ හේග් නුවර පිහිටි 'මාධ්‍යවේදී ඝාතනයන් පිළිබඳ නිත්‍ය මහජන අධිකරණය' (The People's Tribunal on the Murder of Journalist) මගින් නඩු විභාග යක් ආරම්භ කිරීමට නියමිත බව මාධ්‍යවේදීන් ආරක්ෂක කමිටුව (CPJ) සැප්. 28වැනිදා නිවේදනය කළේය.

මෙම අධිකරණය, බිම් මට්ටමේ යුක්තිය සඳහා වූ යාන්ත්‍රණයක් වන අතර ලසන්ත වික්‍රමතුංග, මිගෙල් ඇන්ගල් ලෝපෙස් වෙලස්කෝ සහ නබිල් අල්-ෂර්බාජි යන මාධ්‍යවේදීන්ගේ ඝාතන සඳහා යුක්තිය ඉටු කිරීමට අපොහොසත් වූ බවට එම මහජන අධිකරණය ඉදිරියේ ශ්‍රී ලංකාව, මෙක්සිකෝව සහ සිරියාව යන රාජ්‍යයන් චෝදනා ලැබ සිටී.

මාධ්‍ය නිදහස පිළිබඳ ප්‍රමුඛ පෙළේ සංවිධාන වන ෆ්‍රී ප්‍රෙස් ලිමිටඩ් (FPU), දේශසීමා නොමැති වාර්තාකරුවෝ (RSF) සහ මාධ්‍යවේදීන් ආරක්ෂා කිරීමේ කමිටුව (CPJ) විසින් කරන ලද ඉල්ලීමකට අනුව මෙම නඩු විභාගය ආරම්භ කිරීමට නිත්‍ය මහජන අධිකරණය තීරණය කර තිබේ.

මූලාශ්‍රය: cpj.org

## ව්‍යුහාත්මක කොන්දේසි

**'ව්‍යුහාත්මක කොන්දේසි' යන්න මාධ්‍ය නිදහස පිළිබඳව සලකා බැලෙන වැදගත් සංරචකයකි. මාධ්‍ය පද්ධතියේ සමස්ත ව්‍යුහයට මෙන්ම මාධ්‍ය නිදහස සක්‍රිය කරන සමස්ත පරිසරයට අදාළ වන විභව දර්ශක 6ක් මෙම මානයට ඇතුළත්ය. ඒ අතරින් 'අධීක්ෂණ කණ්ඩායම් මගින් මාධ්‍ය නිදහසට ක්‍රියාකාරී සහාය' යන දර්ශකයට අයත් වන අවස්ථා තුනක් අගෝස්තු මාසයේදී නිරීක්ෂණය විය. ශ්‍රී ලංකාවේ මානව හිමිකම් චර්යාව අධ්‍යයනය කිරීම සඳහා යුරෝපා සංගමයේ දූත මණ්ඩලයක් මෙරට සංචාරයක නිරත වීම, මාධ්‍ය නිදහස සම්බන්ධයෙන් සාධනීය බලපෑමක් ඇති කරන සාධයක් ලෙස නිරීක්ෂණය වේ.**

**4 වගුව: සැප්තැම්බර්: ව්‍යුහාත්මක කොන්දේසි - සිදුවීම් 03**

| අංකය | දර්ශකය | වාර්තා වූ සිදුවීම් සංඛ්‍යාව |
|---|---|---|
| 01 | අධීක්ෂණ කණ්ඩායම් මගින් මාධ්‍ය නිදහසට ක්‍රියාකාරී සහාය | 03 |
| | **එකතුව** | **03** |

1. **ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත හා හදිසිනීතිය පිළිබඳ මාර්ගගත සංවාද මාලාවක් ශ්‍රී ලංකා තරුණ ජනමාධ්‍යවේදීන්ගේ සංගමය සහ ශ්‍රී ලංකා පුවත්පත් ආයතනය විසින් සංවිධානය කිරීම.**

ජනමාධ්‍ය නිදහසද ඇතුළු ප්‍රජාතන්ත්‍රවාදී අයිතිවාසිකම්වලට අභියෝගයක් වන ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත හා හදිසි නීතිය පිළිබඳ මාර්ගගත සංවාද මාලාවක් ශ්‍රී ලංකා තරුණ ජනමාධ්‍යවේදීන්ගේ සංගමය විසින් සැප්තැම්බර් මාසයේදී සංවිධානය කෙරිණි. එම සංවාද මාලාවේ පළමු සංවාදය සැප්. 10 වැනිදා ''ත්‍රස්තවාදය වැළැක්වීමේ පනතේ ඉතිහාසය" මැයෙන් නීතිඥ රමණි මුත්තෙට්ටුවේගම විසින් පවත්වන ලදි.

හදිසි නීතිය පිළිබඳව සංවිධානය කරනු ලබන සාකච්ඡා මාලාවේ පළමු සාකච්ඡාව ''හදිසි නීතිය සහ එහි බලපෑම" මැයෙන් සැප්. 11 වැනිදා පැවැත්වූ අතර, ආචාර්ය දීපිකා උඩගම, ජ්‍යෙෂ්ඨ මාධ්‍යවේදී පෝද්දල ජයන්ත සහ නීතිඥ ජගත් ලියන ආරච්චි ඒ සඳහා සහභාගී වූහ.

''හදිසි නීතිය සහ ජනමාධ්‍ය'' මාතෘකාව යටතේ ශ්‍රී ලංකා පුවත්පත් ආයතනය දෙමළ සහ සිංහල මාධ්‍යයෙන් සංවාද දෙකක් සංවිධානය කර තිබුණි. ඒවා සැප්තැම්බර් 23 සහ 24 දිනවල පැවැත්විණ.

2. **තොරතුරුවලට ප්‍රවේශවීමේ ජාත්‍යන්තර දිනය නිමිත්තෙන් නිදහස් මාධ්‍ය ව්‍යාපාරය විවෘත සංවාදයක් පැවැත්වීම.**

සැප්තැම්බර් 28 දිනට යෙදුණු 'තොරතුරුවලට ප්‍රවේශවීමේ ජාත්‍යන්තර දිනය' නිමිත්තෙන් නිදහස් මාධ්‍ය ව්‍යාපාරය විසින් සංවිධානය කරනු ලැබූ මහජන සංවාදය සැප්තැම්බර් 25 සෙනසුරාදා දින පස්වරු 6.00 ට මාර්ගගතව පවත්වන ලදි. තොරතුරු දැනගැනීමේ පනත භාවිත කරමින් ජය ගත් මොනරාගල මැතිවරණ නඩුව තේමා කොට ගෙන පැවැත්වූ මෙම මහජන සංවාදයේ දේශකයින් ලෙස පැෆරල් සංවිධානයේ විධායක අධ්‍යක්ෂ රෝහණ හෙට්ටිආරච්චි, කොළඹ විශ්ව විද්‍යාලයේ සමාජ විද්‍යා අංශයේ ජ්‍යෙෂ්ඨ කතිකාචාර්ය ආචාර්ය එම්. ඊ. එම් මහීස්, මහනුවර සමාජ සංවර්ධන ආයතනයේ ව්‍යාපෘති කළමනාකාරිනී යෝගොෂ්වරී ක්‍රිෂ්ණන් සහ කන්තලේ ජාතික සහයෝගිතා සංවර්ධන පදනමේ ව්‍යාපෘති කළමනාකරු සුරංග රූපසිංහ යන අය සහභාගී වූහ.

මූලාශ්‍රය: wedabima.lk

3. **ශ්‍රී ලංකාවේ මානව හිමිකම් චර්යාව අධ්‍යයනය කිරීම සඳහා යුරෝපා සංගමයේ දූත මණ්ඩලයක් මෙරට සංචාරයක නිරත වීම.**

ලංකාවේ මානව හිමිකම් චර්යාව අධ්‍යයනය කිරීම සඳහා යුරෝපා සංගමයේ විශේෂ දූත මණ්ඩලයක් සැප්තැම්බර් 27 දා සිට ඔක්තෝබර් 5 වැනිදා දක්වා ශ්‍රී ලංකාවේ සංචාරයක නිරත විය. මෙම කාලය තුළ එම දූත මණ්ඩලය ආණ්ඩුවේ, දේශපාලන පක්ෂවල, වෘත්තීය සමිතිවල, සිවිල් සමාජයේ, සේවායෝජකයන්ගේ මෙන්ම එක්සත් ජාතීන්ගේ ආයතනවල නියෝජිතයින්ද මුණගැසිණි.

ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත ඉවත් කරගැනීම ඇතුළු මානව හිමිකම් ආරක්ෂා කිරීම සඳහා දී ඇති පොරොන්දු ඉටු නොකරන්නේ නම් ශ්‍රී ලංකාවට GSP+ බදු සහනය මෙන්ම ත්‍රස්ත විරෝධී කටයුතු සඳහා ලබාදෙන ආධාරද ඉවත් කර ගැනීම ගැන සලකා බැලීමට යුරෝපා පාර්ලිමේන්තුව විසින් ජූනි මස මැදදී යෝජනාවක් සම්මත කළේය.

මාධ්‍ය මර්දනය හා අදහස් පළ කිරීමේ නිදහසට බාධා කිරීම, එම යෝජනාවෙහි විශේෂ අවධානයට ලක් කර තිබූ

කරුණකි. ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත සුළු ජාතීන් මර්දනයට යොදා ගැනීම, නීතියේ ආධිපත්‍යය පිරිහීම, අතුරුදහන් කිරීම්, අත්අඩංගුවේදී සිදු වන ඝාතන, ළමා ශ්‍රමිකයන් සූරාකෑම සහ කම්කරු අයිතිවාසිකම් අහිමි කිරීම ඇතුළු විවිධාකාර මානව හිමිකම් උල්ලංඝනය වීම් ගැන එමගින් ශ්‍රී ලංකාව දැඩි දෝෂ දර්ශනයට ලක් කර තිබුණි.

මූලාශ්‍රය: newsfirst.lk

**5 වගුව: මාධ්‍ය නිදහස: 2021 ජනවාරි-සැප්තැම්බර් දක්වා නිදහස් මාධ්‍ය ව්‍යාපාරය වෙත වාර්තා වී ඇති සිදුවීම්**

| ආවරණය කර ඇති සංරචකය | 2021 ජනවාරි - අගෝස්තු | | 2021 සැප්තැම්බර් |
|---|---|---|---|
| | පෙර සිදුවීම් | පෙර සිදුවීම්වල වර්ධනයන් | |
| ආරක්ෂාව හා සුරක්ෂිතබව | 37 | | 05 |
| නීතිමය කොන්දේසි | 37 | 04 | 04 |
| මාධ්‍ය ස්වාධීනත්වය | 02 | | - |
| මාධ්‍ය නිදහස සම්බන්ධ ප්‍රවණතා | 01 | | - |
| ව්‍යුහාත්මක කොන්දේසි | 06 | | 03 |
| **එකතුව** | **83** | **04** | **12** |

2021 මාධ්‍ය නිදහස මාසික වාර්තා ජනවාරි-සැප්තැම්බර් දක්වා මෙතැනින් බලන්න

**පසුසටහන:** සිවිල් සමාජ අපේක්ෂාවන්, ජාතික හා ජාත්‍යන්තර නඩු තීන්දු සහ අන්තර්ජාතික ප්‍රඥප්තීන්ටද අනුව යමින්, මාධ්‍ය නිදහස යනු මානව අයිතියක් ලෙස නිදහස් මාධ්‍ය ව්‍යාපාරය පිළිගනියි. සෑම තැනැත්තකුම සතු සිතීමේ නිදහස, හෘදය සාක්ෂියේ නිදහස සහ ආගමික නිදහස මෙන්ම අන් තැනැත්තන්ගේ මත දැනගැනීමට තිබෙන මූලික අයිතිය බාධාවකින් තොරව භුක්තිවිඳීම මානව අයිතියකි. මෙම පදනම මත පිහිටා මාධ්‍ය නිදහස යනු පහත දැක්වෙන දසවැදෑරුම් සංඝටකවල එකතුවක් ලෙස නිදහස් මාධ්‍ය ව්‍යාපාරය සලකයි. (1) සිතීමේ නිදහස (2) මතයක් දැරීමේ නිදහස (3) භාෂණයේ නිදහස (4) සාමකාමීව රැස්වීමේ නිදහස ඇතුළු අදහස් පළ කිරීමේ නිදහස (5) තොරතුරු දැනගැනීමේ නිදහස (6) ශ්‍රව්‍ය, දෘශ්‍ය පටිගත කිරීමේ සහ වාර්තා තබා ගැනීමේ නිදහස (7) ප්‍රකාශනයේ නිදහස (8) පුවත්පත් නිදහස (9) විද්‍යුත් මාධ්‍ය නිදහස (10) අන්තර්ජාල නිදහස යනු එම සංඝටකයන්ය. මෙම සංඝටක අතර ඇත්තේ සහජීවී සම්බන්ධයක් වන අතර එක් සංඝටකයක ඇති වන සීමාවක් මාධ්‍ය නිදහස පිළිබඳ අනෙක් සියලුම සංඝටකයන් භුක්තිවිඳීමේ නිදහස අහුරන බව නිදහස් මාධ්‍ය ව්‍යාපාරය පිළිගනියි. එමෙන්ම වගකීම් විරහිතව හා වෛරී සහගත ලෙස එම නිදහස භාවිත කිරීම යහපත් භාවිතාවක් නොවන බවද නිදහස් මාධ්‍ය ව්‍යාපාරය අවධාරණය කරයි.

මෙම මාසික වාර්තා පිළියෙල කරනු ලබන්නේ ජනමාධ්‍ය වාර්තා සහ නිදහස් මාධ්‍ය ව්‍යාපාරයට ලබා ගත හැකි තොරතුරු අනුව වැඩිදුර තොරතුරු සොයා එම සිදුවීම් විශ්ලේෂණය කිරීමෙනි. මෙම විශ්ලේෂණයේදි නිදහස් මාධ්‍ය ව්‍යාපාරය ඉහත කී දසවැදෑරුම් මාධ්‍ය නිදහස් සංඝටකයන් ආවරණය කරන ජාත්‍යන්තරව පිළිගත් සංරචකයන් හතක් ඔස්සේ තෝරා ගත් නිර්ණායක භාවිත කරයි.

Free Media Movement
Convener | Seetha Ranjanee +94 77 731 2460 | Secretary | Lasantha De Silva +94 71 166 7938
Treasurer | Thaha Muzammil +94 77 374 1026
No 96, Bernard Soysa Mw, Colombo 05. Tel: +94 112368895 Fax: +94 112368895;
Web: www.fmmsrilanka.lk, www.mediareform.lk
Email: fmmsrilanka@gmail.com|Facebook: https://www.facebook.com/fmm.srilanka
Twitter: https://twitter.com/FMMsrilanka|#FMM25